මහජන බැංකුව | மக்கள் வங்கி
PEOPLE'S BANK

# ගිණුම් විවෘත කිරීමේ අයදුම්පත
# බාලවයස්

දිනය | | | | | | | | | | |

Isuru Udana | Sisu Udana | YES TEEN | Ethera Udana

කරුණාකර පහතින් ලබා දී ඇති තොරතුරුවලට අනුව සහ බැංකුවේ නීති හා රෙගුලාසි වලට යටත්ව බාලවයස් ඉතුරුම්/ස්ථිර තැන්පත් ගිණුමක් විවෘත කරන්න.

| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි | |
|---|---|
| ඉතිරි කිරීමේ ගිණුම් අංකය | |
| ස්ථිර තැන්පත් ගිණුම් අංකය | |
| CIF අංකය | |

| තොරතුරු ඇතුලත් කරන ලද්දේ නම සහ සේවා අංකය | නිලධාරි අත්සන සහ සේවා අංකය | කළමනාකාර අත්සන සහ සේවා අංකය |
|---|---|---|
| | | |

| | |
|---|---|
| මුදල් වර්ගය | ☐ ශ්‍රී ලංකා රුපියල් ☐ විදේශීය මුදල් (මුදල් වර්ගය සඳහන් කරන්න) ☐ USD ☐ GBP ☐ EUR ☐ JPY ☐ AUD ☐ වෙනත් .................. (සඳහන් කරන්න) |
| ගිණුම් වර්ගය | ☐ ඉසුරු උදාන ☐ සිසු උදාන ☐ YES TEEN ☐ බාල වයස් - වෙනත් .................. (සඳහන් කරන්න) ☐ එතෙර උදාන ☐ ස්ථාවර තැන්පත් |

## බාලවයස්කරු පිළිබඳ විස්තර

| | |
|---|---|
| මුලකුරු සමග නම | .................................................. (කුමරා/කුමරිය) |
| මුලකුරු වලින් හැඳින්වෙන නම් | .................................................. |
| (උප්පැන්න සහතිකය පරිදි) | .................................................. |
| උපන් දිනය | .................. උප්පැන්න සහතිකයේ අංකය .................. පුරවැසිභාවය .................. |
| ස්ථිර ලිපිනය | .................................................. |
| | .................................................. |
| ජාතික හැඳුනුම්පත් අංකය (ඇත්නම්) | .................. දුරකථන අංකය .................. |
| විදේශ ගමන් බලපත්‍ර අංකය (ඇත්නම්) | .................. කල් ඉකුත්වන දිනය .................. |
| පාසලේ/පෙර පාසලේ නම (සිසු දරු දැරියන් සඳහා පමණි) | .................. ඉගෙනුම ලබන වසර .................. |

## මව/පියා/භාරකරු පිළිබඳ විස්තර

| | |
|---|---|
| මුලකුරු සමග නම | .................................................. (මහතා/මහත්මිය/මෙනවිය/..........) |
| මුලකුරු වලින් හැඳින්වෙන නම් | .................................................. |
| | .................................................. |
| ස්ථිර ලිපිනය | .................................................. |
| | .................................................. |
| තැපැල් ලිපිනය (ස්ථිර ලිපිනයට වඩා වෙනස් වන්නේ නම්) | .................................................. |
| | .................................................. |
| විද්‍යුත් තැපැල් ලිපිනය | .................................................. |
| දුරකථන අංක | දේශීය (නිවසෙහි) .................. විදේශීය .................. ජංගම .................. |
| ජාතික හැඳුනුම්පත් අංකය | .................................................. |
| විදේශ ගමන් බලපත්‍ර අංකය | .................. කල් ඉකුත් වන දිනය .................. |
| බාලවයස්කරුට ඇති සම්බන්ධතාවය | .................................................. |
| වෘත්තිය/රැකියාව | .................................................. |
| රැකියා ස්ථානය සහ ලිපිනය | .................................................. |

කරුණාකර බාලවයස්කරුගේ උප්පැන්න සහතිකයේ සහ අයදුම්කරුගේ මව/පියා/භාරකරුගේ අනන්‍යතාවය තහවුරු කරගන්නා ලේඛණයෙහි ඡායා පිටපතක් අමුණන්න

## ගනුදෙනුකරු හඳුනා ගැනීමේ (KYC) තොරතුරු

අදාළ කොටුව තුළ "✓" ලකුණ යොදන්න (සැ.යු. අංක 1 මව/පියා/භාරකරු, අංක 2 වයස අවු 16 හෝ ඊට වැඩි බාලවයස්කරු)

| වර්ගීකරණය | විස්තරය | ඉතිරි කිරීම් 1 | ඉතිරි කිරීම් 2 | විස්තරය | ඉතිරි කිරීම් 1 | ඉතිරි කිරීම් 2 |
|---|---|---|---|---|---|---|
| ගණුදෙනුවේ ස්වභාවය | මුදල් | | | විද්‍යුත් මුදල් හුවමාරුව (Wire Transfer) | | |
| | චෙක්පත් | | | වෙනත් ............................................. (කරුණාකර සඳහන් කරන්න) | | |
| ගිණුම් විවෘත කිරීමේ අරමුණු සහ භාවිතය | ව්‍යාපාරික | | | ඉතුරුම් / ආයෝජන | | |
| | රැකියාව / වෘත්තීය | | | පවුලට ලැබෙන ආමුඛ ප්‍රේෂණ | | |
| | ණය ගෙවීම | | | නිෂ්පාදන | | |
| | ආනයන/අපනයන | | | ආහාර සැපයුම්/ආපනශාලා | | |
| | තොග වෙළඳාම | | | වෘත්තීය ආදායම් | | |
| | සේවා කර්මාන්ත | | | සිල්ලර වෙළඳාම | | |
| | පෞද්ගලික සේවා | | | වෙනත් ............................................. (කරුණාකර සඳහන් කරන්න) | | |
| අරමුදල්/ධනය ලැබෙන මූලාශ්‍ර | ව්‍යාපාරික ආදායම් | | | ආධාර / ප්‍රදානාධාර (දේශීය/විදේශීය) | | |
| | පවුලට ලැබෙන ප්‍රේෂණ | | | ව්‍යාපාර හිමිකාරිත්වය | | |
| | දේපල වත්කම් / විකුණුම් | | | ආයෝජන | | |
| | උරුමයෙන් | | | බැංකු පහසුකම් | | |
| | වෘත්තීය / රැකියාව | | | වෙනත් ............................................. (කරුණාකර සඳහන් කරන්න) | | |
| | වැටුප් / ලාභ ආදායම් | | | | | |
| අපේක්ෂිත සහ සාමාන්‍යයෙන් මසකට ගිණුමට ලැබෙන තැන්පතුවල (රුපියල් තැන්පතු සහ විදේශ තැන්පතුවල රුපියල් වටිනාකම) | රු. 100,000/- ට අඩු | | | රු. 3,000,001/- සිට 5,000,000/- දක්වා | | |
| | රු. 100,001/- සිට 500,000/- දක්වා | | | රු. 5,000,001/- සිට 7,000,000/- දක්වා | | |
| | රු. 500,001/- සිට 1,000,000/- දක්වා | | | රු. 7,000,001/- සිට 10,000,000/- දක්වා | | |
| | රු. 1,000,001/- සිට 2,000,000/- දක්වා | | | රු. 10,000,000/- ට වඩා වැඩි | | |
| | රු. 2,000,001/- සිට 3,000,000/- දක්වා | | | වෙනත් ............................................. | | |

ඔබ විදේශීය පුද්ගලයෙක්ද?

1 ☐ 2 ☐ ඔව්. මම/අපි ............................................ රටේ පුරවැසියෙක් වෙමි / පුරවැසියන් වෙමු. මාගේ / අපගේ විදේශ ගමන් බලපත්‍ර අංකය/අංකයන් ........................................

1 ☐ 2 ☐ නැත. මම/අපි විදේශ රටක පුරවැසියකු නොවෙමි/පුරවැසියන් නොවෙමු. අනාගතයේදී විදේශ රටක පුරවැසියෙකු/පුරවැසියන් වුවහොත්, ඒ බව බැංකුව වෙත දැනුම් දීමට එකඟ වෙමි/වෙමු.

ඔබ දේශපාලනයට අනාවරණය වූ පුද්ගලයෙක්ද? ☐ ඔව් ☐ නැත

ඔබ විදේශ ගිණුම් සඳහා බදු අයකිරීම් අනුකූලතා පනතේ ප්‍රතිපාදන යටතේ ඇමරිකානු පුද්ගලයෙකුද? ☐ ඔව් ☐ නැත

"දේශපාලනයට අනාවරණය වූ පුද්ගලයෙකු" යන්නට නිර්වචනය
ශ්‍රී ලංකාවේ හෝ විදේශයන් හි සිටින පුද්ගලයන්

- රාජ්‍ය නායකයින් හෝ ආණ්ඩුවේ ප්‍රධානීන්
- දේශපාලකයින්
- ජ්‍යෙෂ්ඨ රාජ්‍ය/අධිකරණ/හමුදා නිලධාරීන්
- රාජ්‍ය සංස්ථා, රාජ්‍ය ආයතන, ස්වායක්ත පුද්ගල/මණ්ඩලයන්හි ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන්
- වැදගත් දේශපාලන පක්ෂ නිලධාරීන්,
- ඉහත සඳහන් පුද්ගලයින්ගේ සමීප ඥාතීන් සහ සමීප ඇසුරක් පවත්වන පාර්ශවයන්

"විදේශීය පුද්ගලයෙකු යන්නට නිර්වචනය"

- විදේශීය රටක පුරවැසියෙකු වෙනත් රටක පදිංචිකරුවෙකු වුවත් විදේශයකදී උපත ලබා එසේ උපත ලද රටෙහි පුරවැසිභාවය අත්නොහල පුද්ගලයින්ද ඇතුළත්ව
- විදේශීය රටක නීත්‍යානුකූල පදිංචිකරුවෙකු
- විදේශීය රටක පදිංචි වී සිටින පුද්ගලයෙකු
- වීසා කාලය මත විදේශීය රටක කිසියම් දින ගණනක් ගත කරන පුද්ගලයෙකු
- විදේශ රටක සංස්ථා, බුදල් හා භාරයන්
- විදේශීය රටක හෝ එයට අයත් බල ප්‍රදේශයකට සම්බන්ධකමක් හෝ අයිතියක් ඇති කිසියම් පුද්ගල ඒකකයක්

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි - අනිවාර්ය පරීක්ෂාව (පහත සඳහන් ලිපි ලේඛණ එකක් මගින් තහවුරු කර ගත යුතුය)

1 නම, උපන් දිනය හා ජාතිය/පුරවැසිභාවය තහවුරු කර ගැනීම

☐ ජාතික හැඳුනුම්පත ☐ විදේශ ගමන් බලපත්‍රය ☐ රියදුරු බලපත්‍රය ☐ වෙනත් (කරුණාකර විස්තර දක්වන්න) ..........................................................

2 ලිපිනය තහවුරු කර ගැනීම

☐ ජාතික හැඳුනුම්පත ☐ රියදුරු බලපත්‍රය ☐ පාරිභෝගික බිල්පත් ☐ වෙනත් (කරුණාකර විස්තර දක්වන්න) ..........................................................

## ස්ථිර තැන්පත් ගිණුම් සඳහා පමණි

මුදල් වර්ගය ............................ අනුපාතය .......... % තැන්පතුවෙහි කාලය (මාස) ☐☐

පොලී ගෙවීමේ කාල පරතරය ☐ මාසිකව ☐ කල්පිරීමේදී

තැන්පතු මුදල ☐☐☐☐☐☐☐☐☐☐ ..........................................................
(ඉලක්කමෙන්) (අකුරෙන්)

ස්වයංක්‍රිය අළුත් කිරීම ☐ ඔව් ☐ නැත | ඔව් නම් ☐ පොලී සහිතව ☐ පොලී රහිතව | පොලී රහිතව අලුත් කරන්නේ නම්, පොලී බැර කල යුතු ගිණුම් අංකය ☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐

නිත්‍ය නියෝගයක් මගින් මෙම ගිණුම සඳහා මුදල් තැන්පත් කිරීමට බලාපොරොත්තු වේ නම් පහත පෝරමය සම්පූර්ණ කරන්න

## නිත්‍ය නියෝග

හර කල යුතු ගිණුම් අංකය ☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐

ගිණුම් හිමි අයගේ නම/නම්

| | |
|---|---|
| මුදල් වර්ගය | ☐ රුපියල් ☐ වෙනත් (කරුණාකර සඳහන් කරන්න) |
| මුදල | ☐☐☐☐☐☐☐☐☐☐ (ඉලක්කමෙන්) .......................................... (අකුරෙන්) |
| කාලය | ☐ මාසිකව ☐ කාර්තුවකට වරක් ☐ මාස 06කට වරක් ☐ වාර්ෂිකව |

ආරම්භක දිනය ☐☐☐☐■☐☐■☐☐ අවසාන දිනය ☐☐☐☐■☐☐■☐☐ හෝ ☐ නැවත දැනුම් දෙන තුරු

ඉහත අංක දරණ මාගේ/අපගේ ගිණුම හර කර ඉහත දක්වා ඇති මුදල් ප්‍රමාණයෙන් ඉදිරියට යෙදෙන නියමිත දිනයන්හී දී ඉහත තොරතුරු වලට අදාළව විවෘත කරන ලද ගිණුමට බැර කිරීමට කටයුතු කරන්න. මෙම මුදල් ප්‍රමාණයන් යැවීම භාර ගැනීමේදී වැරදීමකින් හෝ එවැනි මුදල් යැවීමේදී, ඇති වන ප්‍රමාදයකින් හට ගන්නා අලාභ වෙනුවෙන් කරනු ලබන සියලුම ආදේශයන්ගෙන් බැංකුව නිදහස් බව මෙයින් ප්‍රකාශ කරමි/කරමු.

දිනය : .................................. අත්සන / අත්සන් : ..........................................................

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

| අත්සන සහතික කළේ | AFT පද්ධතිගත කළේ | AFT අනුමත කළේ |
|---|---|---|
| දිනය | දිනය | දිනය |

## හර කාඩ්පත්

| | |
|---|---|
| ඔබට හර කාඩ්පතක් අවශ්‍යද ? | ☐ ඔව් ☐ නැත කාඩ්පතෙහි අංකය |
| මවගේ විවාහයට පෙර නම | |
| OTP කෙටි පණිවිඩ යොමු කල යුතු මව/පියා/භාරකරුගේ දුරකථන අංකය | ☐ කාඩ්පතට සම්බන්ධ සියලු පහසුකම් ☐ ATM මගින් ගනුදෙනු කිරීමේ පහසුකම පමණි |

හර කාඩ්පත් ගණුදෙනු වලට අදාළව එක් වරක් පමණක් ජනනය වන මුර වරචනය ඉහත සඳහන් මව/පියා/භාරකරුගේ ජංගම දුරකථන අංකයට යැවීම සඳහා මම/අපි/ මින් බලය පවරම්/පවරමු.

## ගිණුම අඛණ්ඩව පවත්වාගෙන යාමට පමණක් නාමනය කිරීම

ඉහත නම් සඳහන් බාලවයස්කරුට වයස අවුරුදු 18 සම්පූර්ණ වීමට පෙර මාගේ මරණය සිදුවුවහොත්, ගිණුම අඛණ්ඩව පවත්වාගෙන යාමට මම පහත සඳහන් අය මෙයින් නම් කරමි.

| | | | |
|---|---|---|---|
| නාමිකයාගේ සම්පූර්ණ නම | (මහතා/මහත්මිය/මෙනවිය/............) | | |
| ලිපිනය | | | |
| ජා. හැ. අංකය | | බාල වයස්කරුට ඇති නෑකම | |
| මව/පියා/භාරකරුගේ අත්සන | | දිනය | |

මෙම ප්‍රකාශය නිකුත් කරනුයේ ශ්‍රී ලංකා මහ බැංකුවේ විනිමය පාලන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වෙතටයි:

........................................................................................................ (බාලවයස්කරු)

........................................................................................................

(මව/පියා/භාරකරු) වන මම/අපි මෙම පෝරමයේ සඳහන් කර ඇති සියලුම තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් ප්‍රකාශ කර සිටිමි/සිටිමු.

විදේශ විනිමය පනත යටතේ පනවන ලද 2017 අංක 12 දරණ විද්‍යුත් අරමුදල් හුවමාරු කාඩ්පත (EFTCs) සම්බන්ධ කොන්දේසි පිළිබඳ මම/අපි දැන සිටින බවද එම කොන්දේසි වලට යටත්ව විදේශීය විනිමය ගනුදෙනු සඳහා කාඩ්පත භාවිතයට ගත හැකි බවට අවබෝධයක් ඇති බව මම/අපි මෙයින් තහවුරු කර සිටින අතර, එම කොන්දේසිවලට බැඳී සිටීමට මෙයින් එකඟ වෙමි/වෙමු.

මා/අප වෙත ලබා දී ඇති විද්‍යුත් අරමුදල් පැවරුම් කාඩ්පත භාවිතයට ගෙන මම/අප විසින් සිදු කරන ලද විදේශීය විනිමය හුවමාරු කිරීම පිළිබඳව විනිමය පනතේ අරමුණු උදෙසා සහ මහජන බැංකුවට අවශ්‍ය අවස්ථාවල දී ඒ සම්බන්ධ ඕනෑම තොරතුරක් සැපයීමට ද බැඳී ඇති බවට තවදුරටත් මෙයින් එකඟ වෙමි/වෙමු.

මා/අප වෙත ලබා දී ඇති විද්‍යුත් අරමුදල් පැවරුම් කාඩ්පත භාවිතයට ගෙන අනුමත නොකළ විදේශීය විනිමය ගනුදෙනු සිදුවෙමින් පවතින බව සැක කළ හැකි ප්‍රමාණවත් හේතු සාධක තිබෙන බව පෙනී ගියහොත් එම විද්‍යුත් අරමුදල් පැවරුම් කාඩ්පත මගින් ලබාගත හැකි විදේශීය විනිමය බලයලත් නියෝජිතයා විසින් (බැංකුව) අත්හිටුවිය හැකි බව මම/අපි දනිමි/දනිමු.

මා/අප විදේශීය රැකියාවක නිරතවීම සඳහා ශ්‍රී ලංකාවෙන් නික්මයාමට හෝ විගමනය කිරීමට පෙර මා/අපවෙත ලබාදී ඇති විද්‍යුත් අරමුදල් පැවරුම් කාඩ්පත/කාඩ්පත් මහජන බැංකුව වෙත බාරදීමට එකඟතාවය පළ කරන බව මම/අපි තවදුරටත් පොරොන්දු වෙමි/වෙමු.

................................ ................................................

දිනය බාල වයස්කරු (අවු 13ට වැඩි)

................................ ................................................

දිනය මව/පියා/භාරකරුගේ අත්සන

මම බලයලත් නිලධාරියකු වශයෙන් අයදුම්කරු/අයදුම්කරුවන් විසින් සපයනලද තොරතුරු සහ ඒ හා සම්බන්ධ ලියකියවිලි ඉතා ඕනෑකමින් පරීක්ෂා කර බැලීමි. එම තොරතුරු හා ලියකියවිලි වල නිර්ව්‍යාජභාවය පිළිබඳව සෑහීමකට පත්වීමි. විද්‍යුත් අරමුදල් පැවරුම් කාඩ්පත් හිමිකරුවන් ඔහුගේ/ඇයගේ කාඩ්පත භාවිතයට ගෙන කරනු ලබන විදේශීය විනිමය හා සම්බන්ධ ගනුදෙනු පිළිබඳව සුපරීක්ෂාකාරීවීමට පොරොන්දු වන අතර කාඩ්හිමියා/කාඩ්හිමියන් විසින් ලබාදෙන ලද පොරොන්දු ප්‍රකාශය උල්ලංඝනය කරමින් විද්‍යුත් අරමුදල් පැවරුම් කාඩ්පත භාවිතයට ගෙන එමගින් අනුමත නොකළ විදේශීය විනිමය ගනුදෙනු සිදුවෙමින් පවතින බවට සැක කළ හැකි ප්‍රමාණවත් හේතු සාධක පවතීනම් එම විද්‍යුත් අරමුදල් පැවරුම් කාඩ්පතින් ලබාගත හැකි විදේශ විනිමය අත්හිටුවීමට ක්‍රියාකරන බවත්, එවැනි උල්ලංඝනය කිරීමක් පිළිබඳ කාරණය ශ්‍රී ලංකා මහ බැංකුවේ විනිමය පාලන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වෙත දැනුම්දීමට කටයුතු කරන බවත් පොරොන්දු වෙමි.

දිනය : ................................ ................................................

බලයලත් නිළධාරී තැනගේ අත්සන

## ඉසුරු උදාන/සිසු උදාන/YES TEEN ඉතිරි කිරීමේ/ස්ථිර තැන්පතු/ PFCA බාලවයස්කාර/ PFCA බාලවයස්කාර ස්ථිර තැන්පතු ගිණුමට අදාළ නියමයන් හා කොන්දේසි

### පොදු නියමයන් සහ කොන්දේසි

1 ගිණුම බාලවයස්කරු නමින් ඇරඹිය යුතු අතර බද්ධ ගිණුමක් නොවිය යුතුය.

2 වයස අවු 18ට අඩු බාලවයස්කරුවෙකු වෙනුවෙන් මව/පියා/භාරකරු විසින් ගිණුම ආරම්භ කළ හැකිය. එසේ වුවද වයස අවු 16-18 අතර බාලවයස්කරුවෙකුට තමා විසින්ම YES TEEN ගිණුමක් විවෘත කළ හැකිය.

3 ගිණුම් හිමියාට වයස වසර 18ක් සපිරුණු කළ මෙම ගිණුම් බාණ්ඩ වලට අදාල යෝග්‍යතා නිර්ණායක සපුරාලීම මත පදනම්ව මෙම ඉතිරි කිරීමේ ගිණුම YES ඉතිරි කිරීමේ ගිණුමක්/ PFC ගිණුමක් බවට පරිවර්ථනය කෙරේ. ගිණුම් සක්‍රීය කිරීම සඳහා ගිණුම් හිමියා විසින් අත්සන කරන ලද නව මැන්ඩේට් පතක් ශාඛාව වෙත ඉදිරිපත් කල යුතුය. නව හර කාඩ්පතක් ලබා ගත යුතුය.

4 ගිණුමෙන් මදලු ආපසු ලබා ගැනීම සඳහා උප්පැන්න සහතිකය/ජාතික හැඳුනුම්පත/විදෙස් ගමන් බලපත්‍රය ඉදිරිපත් කල යුතුය.

5 බාලවයස්කරුවෙකුට වයස අවුරුදු 18ක් සපිරෙන තෙක් මුදල් ආපසු ලබා ගැනීමට/ගිණුම වසා දැමීමට අවසර නොලැබේ. කෙසේ වෙතත් බාලවයස්කරුගේ සුභ සිද්ධියට අදාලව ශිෂ්‍යාධාර මුදල්, අධ්‍යාපනය, වෛද්‍ය ප්‍රතිකාර වැනි අරමුණු වෙනුවෙන් බැංකුවේ අභිමතය මත මුදල් ආපසු ගැනීමට අවසර දෙනු ලැබේ. YES TEEN ගිණුමට අදාල වන විශේෂ කොන්දේසි පසුපිටහි දැක්වේ.

6 ගිණුම් හිමියාගේ මරණය සිදුවුවහොත් ශ්‍රී ලංකාවේ නීති වලට අනුව ගිණුමේ ශේෂය ගිණුම් හිමියාගේ නීත්‍යානුකූල හිමිකරුවන්ට ගෙවනු ලැබේ.

7 ගිණුමේ ආරම්භක තැන්පතුව, අවම ශේෂය, පොලී අනුපාතය සහ පොලිය ගණනය කිරීමේ සහ බැර කිරීමේ ක්‍රම වේදයන්, බැංකුව විසින් කලින් කලට පවතින නීති, රෙගුලාසි අනුව වෙනස් කරනු ලැබිය හැකිය.

8 ගිණුම් පවත්වාගෙන යාම සහ බැංකුව විසින් සපයනු ලබන සේවාවන් සම්බන්ධ ගාස්තු අයකර ගැනීම් කලින් කලට ප්‍රකාශයට පත්කරනු මිල ගණන් යටතේ වනු ඇත. එකී ගාස්තු, අයකර ගැනීම් සහ රජය විසින් මෙම ගිණුමට අදාලව පනවනු ලබන බදු අවශ්‍ය විට ගිණුමින් හර කරනු ලැබේ.

9 මෙම ගිණුම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබා දී ඇති උපදෙස් හා නියාමන අවශ්‍යතා ප්‍රකාරව පාලනය වන අතර වරින් වර සංශෝධනය වන ශ්‍රී ලංකාවේ පවත්නා නීති වලින්ද පාලනය වේ.

10 ගිණුම් හිමියාගේ/ගිණුම්හිමියාගේ දෙමව්පියන්ගේ හෝ භාරකරුගේ ලිපිනයේ/පෞද්ගලික තොරතුරු වල කිසියම් වෙනසක් සිදු කිරීම සඳහා බැංකුවට ලිඛිතව කඩිනම් උපදෙස් ලබාදිය යුතුය. බැංකුව විසින් ගිණුම් සම්බන්ධ තොරතුරු සන්නිවේදනය කිරීමේදී ගිණුම විවෘත කරන මව/පියා/භාරකරු විසින් බැංකුවට ලබාදී ඇති ලිපිනයට හෝ දුරකථන අංක හෝ වෙනත් සම්බන්ධ කර ගැනීමේ තොරතුරු ඔස්සේ සිදු කළ හැකිය. ගිණුම් විවෘත කරන මව/පියා/භාරකරු විසින් සම්බන්ධතා තොරතුරු වල වෙනස් වීමක් පිළිබඳව බැංකුවට දැනුම් දීමට අපොහොසත් වීම හේතුවෙන් තෙවන පාර්ශවයකට ගිණුම් තොරතුරු හෙළි වීම සම්බන්ධයෙන් බැංකුව විසින් වගකීමට ලක් නොවේ.

11 ගනුදෙනුකරුට නොදන්වා නීත්‍යානුකූල/නියාමන හේතුමත පදනම්ව ගිණුමේ ඕනෑම ගනුදෙනුවක් සීමා කිරීමට බැංකුවට බලය ඇත.

12 ගිණුමේ විශේෂාංග, ගාස්තු, අනෙකුත් අයකිරීම් පිළිබඳව වෙනස්වීම්, සංශෝධනය කිරීම්, නැවැත්වීම හෝ අලුතින් එකතු කිරීම පිළිබඳව බැංකුව විසින් සාධාරණ කාලයකට පෙර බැංකුවේ නිල වෙබ් අඩවිය වන www.peoplesbank.lk ඔස්සේ හෝ ජනමාධ්‍ය මගින් හෝ බැංකුව විසින් තීරණය කරනු ලබන පෞද්ගලික දැනුම්දීම් ක්‍රමයක් මගින් හෝ දැනුම් දෙනු ලැබේ. තවද, ගිණුමට අදාල වන පොලී අනුපාත පිළිබඳව තොරතුරු බැංකුවේ නිල වෙබ් අඩවිය ඔස්සේ පළ කරනු ලැබේ.

13 පූර්වයෙන් අනාවරණය කරන ලද සහ අදාළ නියාමන අවශ්‍යතාවලට අනුකූලව, බැංකුව විසින් අය කරනු ලබන ඕනෑම ගාස්තුවක් සහ අයකිරීමක් ගෙවීමට පාරිභෝගිකයා එකඟ විය යුතුය.

14 මෙම නියමයන් සහ කොන්දේසි වෙනස් කිරීමට, සංශෝධනය කිරීමට හෝ එකතු කිරීමට බැංකුවට අයිතිය රඳවා ගන්නා අතර එවැනි ඕනෑම වෙනසක් සුදුසු සන්නිවේදන මාර්ගයක් හරහා ගණුදෙනුකරුවන්ට කල්තියා නිසි ලෙස දැනුම් දිය යුතුය. එවැනි සංශෝධනයක් අදාල දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති දින සිට ක්‍රියාත්මක වන අතර, ඉන් පසුව බැංකුවේ සේවාවන් අඛණ්ඩව භාවිතා කිරීමක් සංශෝධිත නියමයන් පිළිගැනීමක් ලෙස සැලකේ.

15 2022 අංක 9 දරණ පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත සහ බැංකුවේ රහස්‍යතා නිවේදනයට අනුකූලව. මාගේ/අපගේ පෞද්ගලික දත්ත නීත්‍යානුකූලව රැස්කිරීමට, භාවිතා කිරීමට, ගබඩා කිරීමට, හෙළිදරව් කිරීමට සහ අන්‍ය ආකාරයකින් සැකසීමෙ සම්බන්ධයෙන් මාගේ/අපගේ පැහැදිලි එකඟත්වය මම/අපි බැංකුව වෙත මෙයින් පළ කර සිටිමි/සිටිමු. එකී පනත යටතේ මාගේ/අපගේ අයිතිවාසිකම් පිළිබඳව මම/අපි දැනුවත් බව පිළිගනිමි/මු.

## YES TEEN ඉතිරි කිරීමේ ගිණුම

1 වයස අවුරුදු 13 - 18 අතර දරුවන් සඳහා විවෘත කළ හැකි වේ.

2 වයස අවුරුදු 13 - 15 අතර දරුවන් සඳහා දෙමව්පිය/භාරකරු විසින් ගිණුම් විවෘත කළ යුතු අතර අවුරුදු 16 - 18 අතර දරුවන් සඳහා තමන් විසින්ම ගිණුම විවෘත කළ හැකිය.

3 මෙම ගිණුමින් මුදල් ආපසු ලබා ගැනීම සඳහා හර කාඩ්පතක් නිකුත් කළ හැකි වේ.

4 හර කාඩ්පතින් දෛනිකව සිදු කරනු ලබන ගනුදෙනු ප්‍රමාණය සීමාවකට යටත්වේ.

5 මෙම ගිණුම් හිමි දරුවන්ගේ ගිණුම් සඳහා කවුන්ටරයෙන් සිදුකරනු ලබන ගෙවීම්, ATM සහ POS යන්ත්‍ර ගණුදෙනු වලට අදාල තොරතුරු කෙටිපණිවිඩයක් දෙමව්පිය/භාකරුගේ ජංගම දුරකථන අංකය වෙත යොමු කරනු ලැබේ.

6 වයස අවුරුදු 18 සම්පූර්ණ වීමත් සමඟ YES TEEN ගිණුම YES ගිණුමක් බවට පරිවර්තනය වන බැවින් YES TEEN හර කාඩ්පත ශාඛාව වෙත භාරදීමටත්, ගිණුම් හිමියාගේ තොරතුරු සහිත නව මැන්ඩේට් පතක් ශාඛාව වෙත ලබාදී ගිණුමේ තොරතුරු යාවත්කාලීන කොට නව හර කාඩ් පතක් ලබාගැනීමටත් කටයුතු කළ යුතුය.

## YES TEEN ඉතිරි කිරීමේ ගිණුම සඳහා නිකුත් කරනු ලබන හර කාඩ්පත

1 YES TEEN හර කාඩ්පත සියලු කල්හි මහජන බැංකුවේ දෙපලක් ලෙස පවතින අතර බැංකුවේ ඉල්ලීම මත කොන්දේසි විරහිතව හා වහාම බැංකුවට ආපසු භාර දිය යුතුය.

2 මෙම කාඩ් පත භාවිතයෙන් ATM සහ CRM යන්ත්‍ර වලින් මුදල් ආපසු ලබා ගැනීම සීමා කර ඇති අතර වෙළඳසැල් වල (POS) ගනුදෙනු සිදු කිරීමටද සීමාවකට යටත්ව අවසර දෙනු ලැබේ.

3 හර කාඩ් පත සඳහා ලබාදෙන රහස් අංකය (PIN) ඉතා රහසිගත ලෙස තබා ගත යුතු අතර කිසිදු අවස්ථාවකදී හෝ කිසිදු තත්ත්වයක් යටතේ එය කිසිම පුද්ගලයෙකුට හෙලි නොකිරීමට ගණුදෙනුකරු පොරොන්දු විය යුතුය.

4 YES TEEN කාඩ්පත භාවිතා කල හැකි වන්නේ ගිණුම් හිමියාට වයස අවුරුදු 18 සම්පූර්ණ වනතුරු පමණි. කාඩ්පත නාතිවුවහොත්, සොරාගෙනු ලැබුවහොත්, එයට හානි වුවහොත් හෝ කල් ඉකුත්වුවහොත් ගිණුම් හිමියා හෝ ගිණුම් හිමියාගේ ගිණුම ආරම්භ කරන ලද මව/පියා/භාරකරු විසින් නව කාඩ්පතක් ලබා ගත යුතුය.

5 කාඩ්පත් පහසුකම ගිණුම්හිමියාට වයස අවු 18 සපිරෙන තුරු හෝ ගිණුම් හිමියාගේ ගිණුම ආරම්භ කරන ලද මව/පියා/භාරකරු විසින් එම පහසුකම අහෝසි කරන ලෙස ඉල්ලීමක් කරන තුරු අඛණ්ඩව පවතී.

6 ගිණුම්කරු හෝ ගිණුම්හිමිකරුගේ මව/පියා/භාකරු YES TEEN කාඩ්පත භාවිතයෙන් සිදුකරන ලබන සියලු ගණුදෙනු පිළිබඳව එම ගනුදෙනු කවරාකාරයෙන් සිදුකළද පූර්ණ වගකීමකට පත්වේ.

7 මෙම නාඩ්පත උපයෝගි කර ගැනීම YES TEEN කාඩ්පතින් ආවරණය වන හෝ වෙනත් ආකාරයේ සියලු සේවා. පහසුකම් හා ගනුදෙනු පාලනය වන බැංකුවේ පවත්නා රීති, රෙගුලාසි සහ නියමයන් සහ කොන්දේසි වලට යටත්වේ.

8 මෙම YES TEEN කාඩ්පත කිසිදු පූර්ව දැන්වීමකින් තොරව හෝ ගිණුම්හිමියාට හෝ ගිණුම්හිමියාගේ මව/පියා/භාරකරුට කිසිදු හේතුවක් නොදක්වා අවලංගු කිරීමේ, ආපසු ලබා ගැනීමේ හෝ අලුත් කිරීමේ පූර්ණ අභිමතය බැංකුව සතුය.

9 වයස අවුරුදු 18ට පෙර මෙම කාඩ්පත් පහසුකම අවසන් කිරීමට/අවලංගු කිරීමට ගිණුම් හිමියා හෝ ගිණුම්හිමියාගේ මව/පියා/භාරකරු විසින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කල යුතුය.

10 YES TEEN කාඩ්පතෙහි සියලු ආදේශන සහ යළි අලුත් කිරීම් දැනට බලාත්මකව පවතින නියමයන් හා කොන්දේසි වලට යටත්වේ.

11 YES TEEN කාඩ්පත භාවිතයෙන් සිදු කෙරෙන සියලු ගනුදෙනු පිළිබඳ බැංකුවේ වාර්තා සහ ප්‍රකාශ ගිණුම්හිමියා හෝ ගිණුම්හිමියාගේ මව/පියා/භාකරු විසින් නිවැරදි බවට පිලිගත යුතුය.

12 කාඩ්පත සොරාගනු ලැබුවහොත්, නැතිවුවහොත් ගිණුම් ආරම්භ කළ මව/පියා/භාරකරු/බාලවයස්කරු වහාම ඒ පිළිබඳව බැංකුව දැනුවත් කළ යුතු අතර ලිඛිත තහවුරුවක්ද බැංකුවට ලබා දිය යුතුය. නැතිවූ/ සොරාගනු ලැබූ හෝ ගිණුම ආරම්භ කළ මව/පියා/භාරකරු/බාලවයස්කරුගේ කැමැත්තෙන් තොරව YES TEEN කාඩ්පත භාවිතයෙන් සිදුවන යම් පාඩුවක් සම්බන්ධයෙන් බැංකුව විසින් වගකීම දරනු නොලැබේ.

## ස්ථිර තැන්පතු ගිණුම

1 ගිණුම් හිමියාගේ වයස සම්පූර්ණ වීමෙන් අනතුරුව බාලවයස් ස්ථිර තැන්පත් ගිණුම සාමාන්‍ය ස්ථිර තැන්පත් ගිණුමක් සේ සැලකෙන අතර සාමාන්‍ය ස්ථිර තැන්පත් ගිණුමකට අදාල පොලී අනුපාතිකය බලපැවැත්වේ.

## PFCA බාලවයස්කාර ඉතිරිකිරීමේ/ස්ථිර තැන්පතු ගිණුම

1 විදේශිය මුදල් ගිණුම් සඳහා මව/පියා/භාරකරුගේ විදේශීය ආදායම පිළිබඳව සාක්ෂි බැංකුවට ඉදිරිපත් කළ යුතුය.

2 විදේශීය මුදල් ගිණුම් වලට සිදු කරන තැන්පතු අණකර, ස්විෆ්ට්/විද්‍යුත් අරමුදල් පැවැරුම් හෝ PFC ගිණුමෙන් මුදල් පැවරීමක් ලෙස පරිවර්තනය කරගත හැකි විදේශීය මුදල් වලින් විය යුතුය.

3 PFCA බාලවයස්කාර ළමා ඉතිරි කිරීමේ යෝජනා ක්‍රමය සඳහා ප්‍රදානය කරනු ලබන රක්ෂණ ප්‍රතිලාභ අඛණ්ඩව පවත්වාගෙන යන්නේද, එසේ නැතහොත් අත්හිටුවන්නේද යන්න, බැංකුව තම තනි අභිමතය අනුව තීරණය කරනු ඇත.

4 විදේශයන්හි සිට බැංකු හරහා ලැබෙන ආමුඛ ප්‍රේෂණ, මව/පියා/භාරකරුගේ PFC ගිණුමෙන් කරනු ලබන පැවරීම් සහ ගිණුමේ පවතින මුදල් සඳහා ලැබෙන පොලී ආදායම් මෙම ගිණුමට බැර කල හැකිය.

**මෙම ගිණුම/ගිණුම් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් සඳහන් කර ඇති කොන්දේසි හා නියමයන් කියවා බලා තේරුම් ගත් අතර, ඒවා පිළිපැදීමට හා ඒවායින් බැඳී සිටීමටත් එකඟ වෙමි/වෙමු.**

| ................................................ | ............................................................ | ................................................ |
|---|---|---|
| මව/පියා/භාරකරු අත්සන | බාලවයස්කරුගේ අත්සන (අවශ්‍ය ගිණුම් සඳහා පමණක්) | දිනය |